**ගොවීන්ගේ භාරකාර අරමුදල - 2021**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ගොවීන්ගේ භාරකාර අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා

ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1. කරුණු අවධාරණය කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 1.10 මඟින් හෙළිදරව් කර ඇති පරිදි ගොවිසෙත ලොතරැයි ආදායමෙන් සියයට 10 ක ප්‍රමාණයක් 1995 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ජාතික ලොතරැයි මණ්ඩලය විසින් මහා භාණ්ඩාගාරයේ ඒකාබද්ධ අරමුදලට බැර කරන ලද සමුච්චිත එකතුව රු.6,010,246,615 ක් වුවත් භාර ඔප්පුවක් මඟින් ස්ථාපිත කර ඇති අරමුදලට වර්ෂ 27 ක කාලය තුළදී අරමුදලේ කාර්යයන් හා කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමට ලබා දී තිබුණේ රු. 955,605,390 ක මුදලක් පමණි. | නැත | ගොවිසෙත ලොතරැයි ආදායම උපරිම කාර්යක්ෂමතාවයකින් භාවිතා කළ යුතු වීම. |

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 150 ඡේදය ප්‍රකාරව අස්ථිත්වයේ නෛතික ස්වභාවය, මෙහෙයුම්වල ස්වභාවය සහ එහි ප්‍රධාන කටයුතුවල විස්තරයක්, අස්ථිත්වයේ මෙහෙයුම් පාලනය කිරීමට අදාළ වන භාරකාර ඔප්පුව පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | අරමුදල සම්බන්ධයෙන් දැක්විය යුතු යැයි විගණන විමසුම මගින් දක්වා ඇති තොරතුරු මෙම වසරේ සිට මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කරනු ඇත. | ප්‍රමිතිය ප්‍රකාරව අවශ්‍ය හෙළිදරව් කිරීම් කළ යුතු වීම. |
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 ප්‍රකාරව ස්ථාවර වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණු රු.1,074,192 ක් වූ වත්කම් සම්බන්ධයෙන් ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධන කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයේදි අදාළ අගයන් ප්‍රත්‍යාගණනය කොට ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | සම්පූර්ණයෙන්ම ක්ෂය කළ වත්කම් ප්‍රත්‍යාගණනය කළ යුතු වීම. |

**1.5.3. ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) උපචිත පදනමට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන බව ගිණුම්කරණ ප්‍රතිපත්තිවල දක්වා තිබුණද එයට පටහැනිව ගොවිසෙත ලොතරැයියේ විකුණුම් ආදායම් මුදල් පදනමට ගිණුම්ගත කර තිබුණි. | 1994 සිට 2015 වර්ෂය දක්වා ගොවිසෙත ලොතරැයි ආදායම ලැබිය යුතු ආදායමක් ලෙසට ගිණුම්ගත කර ඇත. එවිට අරමුදලේ මූල්‍ය තත්ත්වය සම්බන්ධයෙන් සත්‍ය තොරතුරු අනාවරණය නොවන ලෙසට විගණනය විසින් පෙන්වා දුන් බැවින් 2016 වර්ෂයේ සිට සත්‍ය වශයෙන් අරමුදලට ලද ආදායම පමණක් ගිණුම්ගත කොට ලැබිය යුතු මුදල සටහනක් මගින් පෙන්නුම් කර ඇත. | ගිණුම්කරණ ප්‍රතිපත්ති ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) කෘෂිශක්ති ණය යෝජනා ක්‍රමය යටතේ රජයේ බැංකු මඟින් ගොවීන්ට ලබාදී ඇති ණය සඳහා සමාලෝචිත වර්ෂයේ පොලී ආදායම රු.3,488,230 ක් විය යුතු වුවද මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත් පොලී ආදායම රු.2,791,112 ක් වීම හේතුවෙන් පොලී ආදායම සහ ලැබිය යුතු පොලී ආදායම රු.697,118 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2020 වර්ෂයට අදාළව ලැබිය යුතු පොලී ආදායම රු.697,117.27 ක් 2021 වර්ෂයේදී ලැබී ඇත. එය ලැබිය යුතු පොලී ගිණුම බැර කොට ඇත. එය 2020 වර්ෂයට අදාළව ලැබීමකි. මෙය මුදල් පදනමට ගිණුම්ගත කර ඇත. | සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු මුළු පොලී ආදායම ගිණුම් ගත කළ යුතු වීම. |
| (ඇ) 2022 වර්ෂයේ කල්පිරෙන භාණ්ඩාගාර බිල්පත්වල 2021 වර්ෂයට අදාළ පොලිය රු.905,434 ක් වුවද එය රු.3,248,997 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා භාණ්ඩාගාර බිල්පත් පොලී ආදායම සහ ලැබිය යුතු පොලී ආදායම රු.2,343,563 ක් වැඩියෙන් දක්වා තිබුණි. | භාණ්ඩාගාර බිල්පත් සඳහා පොලී ආදායම මුදල් පදනම මත ගිණුම්ගත කර ඇති අතර මෙම වසරේ උපචිත පදනම මත ගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති ප්‍රකාරව ලැබිය යුතු භාණ්ඩාගාර බිල්පත් පොලිය ගිණුම් ගත කළ යුතු වීම. |
| (ඈ) මූල්‍ය ප්‍රකාශනවල උපචිත පදනමට ගිණුම්ගත කරන බව හෙළිදරව් කර තිබුණි. එසේ වුවද ඉකුත් වර්ෂයට ලැබිය යුතු බඩ ඉරිඟු ණය පොලී ආදායම සඳහා ප්‍රතිපාදන සලසා නොතිබියදී, සමාලෝචිත වර්ෂයේදී ඉකුත් වර්ෂය වෙනුවෙන් ලැබුණු බඩ ඉරිඟු ණය පොලිය රු.228,508 ක් සමාලෝචිත වර්ෂයේ පොලී ලැබීම් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | පිළිගනිමි. 2020 වර්ෂයේ නොවැම්බර් 20 වෙනි දින මෙම ණය ලබා දී ඇති අතර 2020 වර්ෂයේ දින ගණනට අදාළ පොලී මුදල ලැබිය යුතු ලෙස සටහන් වී නොමැත. මෙම ණය මුදල මාස 06 කාලසීමාවක් යටතේ පියවා අවසන් කිරීමේ පදනම මත ලබා දී ඇති බැවින් අදාළ ලැබිය යුතු පොලී ආදායම 2021 වර්ෂයට අදාළ පොලී ආදායමක් ලෙස සටහන් කොට ඇත. | ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව ණය පොලිය ගිණුම් ගත කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ඉ) 2022 වර්ෂය තුළ කල් පිරෙන මහජන බැංකුවේ ස්ථාවර තැන්පතු දෙක සඳහා 2021 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොලී වටිනාකම රු.3,861,301 ක් විය යුතු නමුත්, පොලී ආදායම රු.10,178,963 ක් ලෙස දැක්වීම හේතුවෙන් පොලී ආදායම සහ ලැබිය යුතු පොලී ආදායම අතර වෙනස රු. 6,317,662 ක් මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂය තුළ කල් පිරෙන සහ වටිනාකම රු.125,000,000 ක් වූ මහජන බැංකුවේ ස්ථාවර තැන්පතු දෙක සඳහා 2021.12.31 දිනට ගණනය කර ඇති රු.3,861,301 ක පොලී වටිනාකම 2021 වර්ෂය තුළදී ලැබිය යුතු පොලී වටිනාකම වේ. අදාළ වෙනස ලෙජර් ගිණුම් වල ආරම්භක ශේෂය වන අතර මෙම වර්ෂයේදි නිවැරදි කිරිමට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදි කළ යුතු වීම. |
| (ඊ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් ලෙස දක්වා ඇති රු.7,241,656 ක් වූ ඉතිරිකිරීමේ ගිණුමේ ශේෂය සත්‍ය වශයෙන්ම පවතින ශේෂයක් නොවන බව නිරීක්ෂණය විය. | මෙම ශේෂය 2002 වර්ෂයේ පටන් අවසන් ගිණුම් වාර්තාවල පෙන්නුම් කෙරෙන අතර එම මුදල කපා හැරීම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | පරීක්ෂණයක් සිදු කර එහි තීරණය මත කපා හැරීම කළ යුතු වීම. |
| (උ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම්වල ඉකුත් වර්ෂවල සිට පැවත එන රු.1,193,727 ක වෙනත් ලැබිය යුතු පොලී ශේෂය, කෙටිකාලීන ණය ශේෂ 5 ක එකතුව රු.18,354,761 ක් සහ භාරකාර අරමුදල පිහිටුවීමේදී පවරා ගෙන තිබුණු රු9,112,579 ක් වූ ගොවි බැංකු දිගු කාලීන ණය ශේෂයක් පවතින බවට හෝ අයකර ගැනීමේ හැකියාව තහවුරු කර ගැනීමට නොහැකි විය. | ගොවීන්ගේ භාරකාර අරමුදල තවත් අරමුදල් දෙකක් ඒකාබද්ධ කිරීමෙන් ස්ථාපිත කර ඇති අරමුදලකි. එහි දී ඒකාබද්ධ කරන ලද අරමුදල්වල එවකට පැවති ශේෂයන් එපරිදිම ගොවීන්ගේ භාරකාර අරමුදල වෙත පවරා ඇත .එමගින් ඇතැම් ශේෂයන් මේ වන විට නිරවුල් වී ඇති අතර තොරතුරු සොයාගැනීමට නොහැකි ශේෂයන් තවදුරටත් ශේෂව පවතී. එවකට සිට පැවත එන වෙනත් ණය පොලී ශේෂයන් පොත් වලින් ඉවත් කිරිමට කටයුතු කරමින් පවති. | අයකර ගැනීමේ හැකියාව නොමැතිනම් කපා හළ යුතු වීම. |

### 1.5.4. නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| ගොවිසෙත ලොතරැයි ආදායම | 5,054,641,225 | 5,033,927,559 | 20,713,666 | අරමුදලේ ගොවිසෙත ලොතරැයි ආදායමේ ශේෂය හා මහාභාණ්ඩාගාරයේ ශේෂය අතර වෙනස දන්වා එවන ලෙස ජාතික ලොතරැයි මණ්ඩලය වෙත දන්වා යවා ඇත. | වෙනස හඳුනාගෙන නිවැරදි කළ යුතු වීම. |

### 1.5.5. විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| (අ)ගොවීන්ගේ තැන්පතු | 697,644 | විස්තරාත්මක උපලේඛන සහ ශේෂ සනාත කිරීම. | ගොවීන්ගේ භාරකාර අරමුදල පිහිටුවීමේදී මෙම ශේෂයන් පැවරීමක් සිදුකොට ඇත. මෙම ශේෂවලට අදාළ ශේෂ ලැයිස්තුවක් පමණක් පවතී. | නොපමාව නිවැරදි විස්තර ඉදිරිපත් කළ යුතු වීම. |
| (ආ)කොටස් ගිණුමේ ශේෂය | 591,965 | කොටස් සහතිකය | - එම- | නොපමාව විස්තර ඉදිරිපත් කළ යුතු වීම. |
| (ඇ)ගොවිසෙත අරමුදල් ශේෂය | 159,399,408 | විස්තරාත්මක උපලේඛන සහ ශේෂ සනාත කිරීම | - එම- | නොපමාව විස්තර ඉදිරිපත් කළ යුතු වීම. |

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 ව්‍යවස්ථාව සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | මූල්‍ය විනය පවත්වා ගැනීම සඳහා විසර්ජන පනතින් අනුමත නොකර අයවැයට පරිබාහිරව ආදායම් රැස්කිරීම හා වියදම් දැරීම අනුමත නොකළ යුතු වුවත්, 1994 මාර්තු 09 දිනැති ගොවීන්ගේ භාරකාර ඔප්පුව මගින් ස්ථාපිත කර ඇති අරමුදල පාර්ලිමේන්තුවේ අනුමැතියකින් තොරව ක්‍රියාත්මකවනු ලබයි. | පනත් කෙටුම්පත සම්මත කර ගැනීමට අදාළ කටයුතු මේ වන විට කටයුතු සිදු වෙමින් පවතින අතර මේ පිළිබඳ සාකච්ඡාවක් මුදල් අමාත්‍යාංශය වෙතින් ඉල්ලීම් කර ඇත. ඉන් අනතුරුව මේ සම්බන්ධයෙන් ගත යුතු ඉදිරි කටයුතු කඩිනමින් සිදු කර අවසන් කිරීමට කටයුතු කරමි. | කඩිනමින් පාර්ලිමේන්තු වෙහි පනතක් සම්මතකරවා ගත යුතු වීම. |
| (ආ) 1994 මාර්තු 9 දිනැති ගොවීන්ගේ භාරකාර අරමුදලේ භාරකාර ඔප්පුව 14 වන වගන්තිය | භාරකාර අරමුදල සඳහා කාර්ය මණ්ඩලයක් සහ බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කරගෙන අනුමත කර ගෙන නොතිබුණි. | අරමුදලේ පනත සම්මතවීමෙන් පසුව කාර්ය මණ්ඩල පටිපාටියක් සකස් කොට ස්ථිර කාර්යමණ්ඩලයක් බඳවා ගැනීමට කටයුතු කරනු ඇත. | බඳවාගැනීමේ පටිපාටියක් සකස්කර ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 15.1 ඡේදය | චක්‍රලේඛයෙහි දින සිට වසරක් ඇතුළත පනතක් නොමැති ව්‍යවස්ථාපිත හා භාර අරමුදල් සඳහා පනතක් පිළියෙල කර පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු වුවත් එකී කාලය අවසන් වී තිබුණ නමුත් මෙම අරමුදල සඳහා පනතක් අනුමත කරවාගෙන නොතිබුණි. | පනත් කෙටුම්පත සම්මත කර ගැනීමට අදාළ කටයුතු මේ වන විට සිදු වෙමින් පවතින අතර මේ පිළිබද සාකච්ඡාවක් මුදල් අමාත්‍යාංශය වෙතින් ඉල්ලීම් කර ඇත. ඉන් අනතුරුව මේ සම්බන්ධයෙන් ගත යුතු ඉදිරි කටයුතු කඩිනමින් සිදු කර අවසන් කිරීමට කටයුතු කරමි. | පනතක් පිළියෙල කර පාර්ලිමේන්තු වෙහි අනුමත කරවා ගත යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.80,149,176 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු38,549,215 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.41,599,961 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සමාලෝචිත වර්ෂය තුළදී මහා භාණ්ඩාගාරයෙන් ගොවිසෙත ලොතරැයි ආදායම රු.100,000,000 ක් ලැබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2002 සිට 2004 දක්වා අවස්ථා 9 කදී එකතුව ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සඳහා රු.102,662,700 ක් ණය මුදල් ලබාදී තිබුණි. එම ණය මුදලින් රු.9,000,000 ක් වසරක් ඇතුළත දීත්, රු.93,662,700 ක් මහනුවර පිහිටි මහබේරියතැන්න වත්ත නමැති ඉඩම විකුණූ වහාමත් අයකරගැනීමට ගිවිසුම් ප්‍රකාරව එකඟවී තිබුණු නමුත් එකඟවූ ලෙස අයකර ගැනීමට කටයුතු නොකිරීම නිසා 2021 දෙසැම්බර් 31 දිනට අයකරගැනීමට පවතින ණය ශේෂය රු.60,812,700 ක් සහ උපචිත පොලිය රු.98,023,448 ක්, ණය මුදල් ලබාදී වසර 20 ක් ගතවී තිබුනද තවදුරටත් අයකර ගැනීමකින් තොරව පවතී. | 2013 වර්ෂය අවසානයට රු.98,412,700 ක ණය ශේෂය 2022.05.31 දින වන විට රු.59,212,700 කි. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වෙත අවස්ථා ගණනාවකදීම මෙම ණය මුදල කඩිනමින් ගෙවා අවසන් කරන ලෙසට දන්වා ඇතත් මණ්ඩලයේ පවතින මූල්‍ය තත්ත්වය අනුව මාසිකව රු. 400,000 කට වඩා ගෙවීමට නොහැකි බව දන්වා ඇත. | ගිවිසුම් ප්‍රකාරව ණය සහ පොලිය අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ආ) මාස 24 ක් තුළ අයකර ගැනීමට එකගවී රු.500,000 ක මුදලක් අර්තාපල් බෝග වගාව සඳහා නුවර එළිය දිස්ත්‍රික්කයේ පිහිටි වලපන ග්‍රාමයේ ගොවියකු වෙත 2016 වර්ෂයේදී නිදහස් කර තිබුණි. ව්‍යාපෘතිය සඳහා රු.1,000,000 ක මුදලක් භාරකාර අරමුදල විසින් අනුමත කර තිබුණු අතර ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්වරයා විසින් ව්‍යාපෘති කටයුතු සාර්ථකව ක්‍රියාත්මක කර නොමැති බව වාර්තා කර තිබීම හේතුවෙන් ඉතිරි මුදල නිදහස් කර නොතිබුණි. ණය මුදල ලබා දී වසර 6 ක් ගතවී ඇතත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ලබාදුන් රු.500,000 ක ණය මුදල හා පොලිය අයකරගෙන නොතිබුණි. | මේ සම්බන්ධව නීතිමය කටයුතු සිදු කිරීමට ගොවිජන විනිශ්චය සභාව වෙත යොමු කොට ඇත. | එකඟවූ පරිදි මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) ගොවීන්ගේ භාරකාර අරමුදල විසින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මාර්ගයෙන් බඩ ඉරිඟු වගා කරන ගොවීන් වෙත සියයට 6 ක පොලියක් යටතේ ණය ලබා දීම සඳහා රු.200,000,000 ක් ලබාදී තිබුණි. මෙසේ ලබා දෙන ලද ණය මුදල සඳහා සියයට 1 ක පොලියක් සමඟ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ආපසු ගොවීන්ගේ භාරකාර අරමුදල වෙත පියවිය යුතු වුවත්, ණය මුදල පියවීමේදී 2021 දෙසැම්බර් 31 දින වන විට රු.1,400,959 ක් වූ පොලී මුදලක් අයකරගෙන නොතිබුණි | මෙම ණය මුදලින් මේ වන විට රු.මි.139.2 ක් අය වී ඇත. පොලී මුදල සමඟ ඉතිරි ශේෂය ඉදිරියේදී අයකර ගැනීම සඳහා නිරන්තර දැනුම්දීම් කරනු ලැබේ. | වාරික මුදල් සමඟ පොලී මුදල් ද අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පුරන් කුඹුරු අස්වැද්දවීමේ විශේෂ වැඩ සටහන යටතේ 2020/21 වර්ෂයේදී රු.25,000,000 ක් ණය මුදලක් ලෙස ගොවීන්ට ප්‍රදානය කිරීම සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යාල වෙත නිදහස්කර තිබුණු අතර දිස්ත්‍රික් කාර්යාල විසින් එම මුදලින් රු.10,519,024 ක් ගොවීන් වෙත ලබා දී නොතිබුණි. | ව්‍යාපෘතිය ආරම්භයේදී ඉල්ලුම් කරන ලද ගොවීන් ණය ලබා ගැනීම සඳහා ඉදිරිපත් වී නොමැති බැවින් එම මුදල ඉතිරි වී නැවත අරමුදල වෙත එවා ඇත. | අපේක්ෂිත අයුරින් සැලසුම් ක්‍රියාත්මක කළ යුතු වීම. |
| (ආ) පසුගිය වර්ෂයේදී විගණනය විසින් පෙන්වා දෙන ලද පරිදි පොළොන්නරුව දිස්ත්‍රික්කය පුරා විහිදී ඇති කුඹුරු අක්කර 3,000 ක් Global Gap සහතිකකරණ ක්‍රමවේදයට අනුව 2018/2019 වගා කිරීම, ජාත්‍යන්තර ප්‍රමිතකරණය ක්‍රමවේද පිළිබඳ ගොවි ජනතාව දැනුවත් | නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා මූලික පියවර වශයෙන් දැනට පොළොන්නරුව පොලිස් ස්ථානයේ පැමිණිල්ලක් ගොනු කර ඇත. | සැලසුම් ප්‍රකාරව ගෙවිලියන් වෙත ගැප් සහතික නිකුත් කර ණය මුදල පියවා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| කිරීමේ හා පරිසර හිතකාමී තිරසර කෘෂිකාර්මික ක්‍රමවේදය අනුගමනය කිරීමෙන් ආර්ථික වාසි අත්පත් කර ගැනීම අරමුණු කර ගෙන පිහිට වූ රන් ගෙවිලිය සමාජ ව්‍යවසාය පොදු සමාගමට වසරක කාලයකින් ගෙවීමේ පදනම මත රුපියල් මිලියන 5.9 ක පොළී රහිත ණයක් ලබා දී තිබුණි. ව්‍යාපෘති කාල රාමුව අනුව 2019 මාර්තු මස වන විට ගෙවිලියන් ගේ වී නිෂ්පාදනය වෙනුවෙන් GAP (Good Agriculture Practice) සහතිකය ලබා ගැනීමට අපේක්ෂා කළද 2021 දෙසැම්බර් වන විටත් එකදු ගෙවිලියක් හෝ අපේක්ෂිත මට්ටමට ළඟා වී නොතිබුණු අතර භාරකාර අරමුදල විසින් ලබා දුන් ණය මුදලද මෙතෙක් අයකරගෙන නොතිබුණි. | | |
| (ඇ) 2002 වර්ෂයේදී චක්‍රීය අරමුදල සහ කෘෂිකාර්මික භාර අරමුදල එකාබද්ධ කර ගොවීන්ගේ භාරකාර අරමුදල පිහිටුවීමේදී එම අරමුදල් දෙකෙහි පැවති හර හා බැර ණය ශේෂයන් ගොවීන්ගේ භාරකාර අරමුදලට පවරා දෙන ලදී. එහිදී අරමුදලට පවරන ලද චක්‍රීය අරමුදලේ රු.44,255,850 ක කෙටි කාලීන ණය ශේෂය අයකරගැනීම සඳහා 2014 වර්ෂයේදී රු.1.490,000 ක දීමනා ගෙවා විශ්‍රාමික නිලධාරින් 10 දෙනෙකු පත් කර තිබුණු නමුත්, තව දුරටත් 2019 වර්ෂයේ සිට අයකර නොගත් ණය රු.39,967,891 ක් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එමින් පැවතුණි. | 2014 වර්ෂයේදී අය නොවන ණය ශේෂ විමර්ශනයට පත් කළ නිලධාරින් විසින් සොයාගන්නා ලද තොරතුරු පදනම් කරගෙන ගොවි කමිටුවලින් අදාළ ණය ශේෂ කොටස් වශයෙන් අයකර යම් ප්‍රමාණයක් ගොවි භාරකාර අරමුදල වෙත එවා ඇත. මේ වන විට මෙම ශේෂය රු. 39,960,891 ක් දක්වා අඩු වී ඇත. | ණය මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඈ) පුද්ගලික සමාගමක් වෙත 2003 වසරේදී ලබාදී ඇති රු.3,500,000 ක ණය මුදලින් රු.860,000 ක්, සහ උපචිත පොලී වටිනාකම රු.676,666 ක් තව දුරටත් අයවීමට පැවතුණි. මෙම සමාගම ව්‍යාපාරික කටයුතු නවතා ඇති බව හා ණය මුදල ලබා ගත් පුද්ගලයා මිය ගොස් ඇති බව අරමුදල වෙත දැනුම් දී ඇති බැවින් තව දුරටත් ණය අයකරගැනීමේ හැකියාව පිළිබඳව සාධාරණ පරීක්ෂාවක් සිදු කර අයකර ගැනීම හෝ අවශ්‍ය නීතිමය පියවර ගැනීම සිදු කළ යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි. | මෙම ආයතනය වෙත නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙස දැනුවත් කොට ඇති අතර මේ වන විට එන්තරවාසි ද යොමු කොට ඇත. ඒ සඳහා ලබාදී ඇති කාලසීමාව ඉක්මවා ගොස් ඇති බැවින් මේ සම්බන්ධයෙන් නීතිපති උපදෙස් ගෙන ක්‍රියා කිරීම සඳහා කටයුතු කරමින් පවතී. | ණය මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඉ) ලොකු ළූනු බීජ නිෂ්පාදනය කරනු ලබන ගොවීන් 63 දෙනෙකු සඳහා 2016 වර්ෂය වන විට රු.11,370,000 ක ණය මුදලක් ප්‍රදානය කර තිබුණි. එකඟව තිබුණු කොන්දේසි ප්‍රකාරව ණය මුදල අයකර නොගැනීම නිසා 2021 දෙසැම්බර් 31 දිනට රු.4,244,583 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ණය මුදල ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා ගොවි බැංකු මගින් ගොවීන් වෙත ලබා දී ඇත. ඉතිරි ශේෂය කොටස් වශයෙන් අයවේ. | එකඟවූ පරිදි අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඊ) වසරක් ඇතුළත අයකර ගැනීමේ කොන්දේසිය යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ බඩ ඉරිඟු වගා කරන ගොවීන් 10,000 ක් වෙත ලබා දීමට ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙත රු.90,000,000 ක් 2015 වර්ෂයේදී ලබා දී තිබුණු අතර 2021 දෙසැම්බර් 31 | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොවි බැංකු හරහා ගොවීන් වෙත ලබා දී ඇති ණය මුදලේ ඉතිරි ශේෂය කොටස් වශයෙන් අයවේ. කඩිනමින් | ණය අයකර ගැනීමේදී කොන්දේසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | |
|---|---|
| දින වන විට වසර 5 ක් ගත වී තිබුණද රු.24,421,032 ක ශේෂයක් අයවීමට පැවතුණි. | අයකර එවන මෙන් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව නිරන්තර දැනුවත් කිරීම් කරනු ලැබේ. |

**3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවීන්ගේ භාරකාර අරමුදල පිහිටුවීමේ ප්‍රධාන අරමුණ ක්‍රියාත්මක කිරීමට මුදල් උපයෝජනය නොකර භාරකාර අරමුදලේ මුදල් දිගින් දිගටම ස්ථාවර තැන්පතුවල සහ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතුවල රු.365,001,919 ක් සහ භාණ්ඩාගාර බිල්පත්වල රු.97,821,406 ක් ආයෝජනය කර පොලී ආදායම ලෙස රු.26,512,574 ක් උපයා තිබුණි. | අරමුදලේ අතිරික්ත මුදල් රජයේ බැංකුවල උපරිම ප්‍රතිලාභ ලැබෙන පරිදි ආයෝජනය කර ලබා ගන්නා පොලී ආදායම්ද රටේ සුළු ගොවීන්ගේ සංවර්ධන වැඩසටහන් හා විවිධ ණය වැඩසටහන් සඳහා ඵලදායීව උපයෝජනය කරනු ඇත. ඒ අනුව මහා භාණ්ඩාගාරයට වැය බරක් නොවී අරමුදල පවත්වා ගැනීමට හැකි සෑම උත්සාහයක්ම දරා ඇත. | භාරකාර අරමුදල පිහිටුවීමේ ප්‍රධාන අරමුණ සඳහා මුදල් උපයෝජනය කළ යුතු වීම. |

**4. ශිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ I කොටසෙහි 15.1. ඡේදය මගින් ඇතුළත් කළ මු.රෙ.877(2)(ඇ) වගන්තිය ප්‍රකාර අරමුදල් විසින් එම අරමුදල සඳහා වන මූල්‍ය ප්‍රකාශනද සමඟ කාර්යසාධන වාර්තාවක් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට පිටපතක් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් භාරකාර අරමුදල විසින් කාර්යසාධන වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී කාර්යසාධන වාර්තා කාලීනව ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**4.2 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනත 40 වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම පිණිස ආස්ථිතායන්හි පාලක මණ්ඩලය විසින් යථා පරිදි පත්කරනු ලබන තමාගේම අභ්‍යන්තර විගණකවරයෙකු පත්කරගත යුතු වුවත් භාරකාර අරමුදල විසින් අභ්‍යන්තර විගණකවරයෙකු පත්කරගෙන නොතිබුණි. | කෘෂිකර්ම අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් විගණනය කරනු ලැබේ. | අභ්‍යන්තර විගණකවරයෙකු පත්කරගත යුතු වීම. |

**4.3 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1. ඡේදයෙන් ඇතුළත් කළ මුදල් රෙගුලාසි 877(1)(ඇ) ඡේදය ප්‍රකාරව පවත්නා වර්ෂයේ අයවැය ලේඛනය සැප්තැම්බර් 30 දිනට පෙර මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීම සඳහා ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කළ යුතු අතර එහි පිටපතක් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කළ යුතු වුවත් එසේ යොමු නොකර වර්ෂය තුළ රු.28,164,693 ක වියදම් දරා තිබුණි. | අය වැය සැකසීමේදී අවිච්ඡේද ව්‍යාපෘති වල වටිනාකමද ඇතුළත් කර ඇත. අයවැය ලේඛනය නිශ්චිත දිනට ප්‍රථම ඉදිරිපත් කිරීම සඳහා ඉදිරියේදී කටයුතු කරනු ඇත. | අයවැය ලේඛනය සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතු වීම. |